# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(6 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 6 ශ්‍රේණිය - තෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **6 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 01. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.7 නාට්‍යය යනු කුමක්දැයි හඳුනා ගනියි. | ▪ අභිනය යන්න පැහැදිලි කරයි.<br>▪ සතර අභිනය නම් කර විස්තර කරයි.<br>▪ චරිත නිරූපනය සඳහා අභිනය යොදාගතහැකි ආකාරය පැහැදිලි කරයි.<br>▪ අභිනය භාවිත කරමින් විවිධ චරිත නිරූපණය කරයි. | ▪ අනුකරණ ක්‍රියාවලිය උදෙසා අභිනය භාවිත කිරීම. | 1.7 අභිනය හඳුනා ගනිමු. | 02 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිකල්පනය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණ කරණයෙ හි යෙදෙයි. | 2.11 අපතේ යන ද්‍රව්‍ය හා ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන නිර්මාණය කරයි. | ▪ සරල වෙස් මුහුණු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගනිමින් නම් කරයි.<br>▪ අපතේ යන ද්‍රව්‍ය සහ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින් අලංකාර නිර්මාණ සිදුනළ හැකි බව පිළිගෙන අදහස් දක්වයි.<br>▪ සරල වෙස් මුහුණු නිර්මාණය කරයි | ▪ අපතේ යන ද්‍රව්‍ය සහ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන<br>▪ නිර්මාණ කරයි. | 2.11.1 මුහුණු හදමු. | 02 |
| | | ▪ රංග ආභරණ සෑදීමට යොදාගත හැකි අමුද්‍රව්‍ය හඳුනා ගෙන නම් කරයි.<br>▪ රංග ආභරණය නිර්මාණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පැහැදිලි කරයි.<br>▪ රංග ආභරණ සහ සාමාන්‍ය ආභරණ අතර ඇති වෙනස්කම් පැහැදිළි කරයි.<br>▪ වළලු, මාල, කරාබු වැනි සරල රංගාභරණ නිර්මාණය කරයි. | ▪ අපතේ යන ද්‍රව්‍ය සහ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන<br>▪ රංගාභරණ නිර්මාණ කරයි | 2.11.2 වළලු මාල මුදු කරාබු ඔටුණු<br>අපිම සදා පළඳා අපි රඟමු | 02 |
| | 2.12 ජනකතාවක ඇති නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි. | ▪ ජන කතන්දරවල නාට්‍යෝචිත අවස්ථා තෝරා දක්වයි.<br>▪ ජන කතන්දර නව අර්ථකථනයක් සහිතව රංගනයේ යෙදෙයි. | ▪ ජන කතාවක අන්තර්ගතය හා නාට්‍යාවස්ථා පිළිබඳ සොයා බැලීම. | 2.12 ජනකතාවක් ඇසරින් නාටෝචිත අවස්ථා තෝරා ගනිමින් රූපණයේ යෙදෙයි. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.13 නිර්මාණාත්මක හැකියා වර්ධනය කරයි. | ▪ උචිත පරිදි නාට්‍යෝචිත අවස්ථා පෙළ ගස්වයි.<br>▪ රංග විධාන සහිත ව නාට්‍ය පෙළ සැලසුම් කරයි.<br>▪ සාමූහික ව එක්ව නාට්‍ය පෙළ රචනා කරයි. | ▪ ජනකතා ඇසුරින් සරල නාට්‍ය පෙළක් රචනා කිරීම. | 2.13.1 ජනකතා ඇසුරින් සරල නාට්‍ය පෙළක් රචනා කරමු. | 01 |
| | | ▪ රචනා කරන ලද පෙළෙහි දක්වෙන භූමිකා සඳහා ගැළපෙන නළු නිළියන් තෝරා ගනියි.<br>▪ නාට්‍ය පෙළ රංගයක් බවට පත් කරයි | ▪ රචනා කරන ලද නාට්‍ය පෙළ රංගයක් බවට පත් කරමු. | 2.13.2 නාට්‍ය පෙළ රංගයක් බවට පත් කරමු. | 02 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | 3.6 ජන ක්‍රීඩා ඇසුරින් සාමූහික රංගනයේ යෙදේ. | ▪ සාමූහික ව රංගනය කළ හැකි ජන ක්‍රීඩා නම් කරයි.<br>▪ දේශීය ජන ක්‍රීඩා ඇතුළත් සංස්කෘතිකාංග අධ්‍යයනයට කැමැත්ත ප්‍රකාශ කරයි.<br>▪ ජන ක්‍රීඩා ඇසුරින් සාමූහික ව කළ හැකි රංගයන් නිර්මාණය කරයි. | ▪ සාමූහික රංගනයට උචිත ජන ක්‍රීඩාවල යෙදීම. | 3.6 'ජන ක්‍රීඩා අනුව රඟමු' | 01 |
| 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳ ගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නාට්‍ය පෙළ රස විඳියි. | ▪ නාට්‍ය පෙළෙහි එන චරිත නම් කරයි.<br>▪ පෙළෙහි මූලික නාට්‍යමය අවස්ථා නම් කරයි.<br>▪ පෙළ පැහැදිලිව හා අර්ථවත්ව කියවයි.<br>▪ නාට්‍ය පෙළෙහි එන ඒ ඒ චරිත වලට ගැලපෙන පරිදි සංවාද උච්ඡාරණය කරයි.<br>▪ පෙළෙහි තේමාව හඳුනා ගනිමින් අර්ථය අනුව ඇති විවිධ පණිවිඩ ප්‍රකාශ කරයි. | ▪ නාට්‍ය පෙළ රස විඳීම. (නිර්දිශ්‍ය නාට්‍ය පෙළ - පුංචි අපට දූන් තේරෙයි.)<br>▪ තේමාව<br>▪ චරිත | 5.1 නාට්‍ය පෙළ රස විඳියි.<br>5.1.1 චරිතවලට බෙදී පෙළ හඬ නගා කියවමු. | 01 |
| | | ▪ කතා වස්තුව කතන්දරයට වඩා වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>▪ කථා පුවතෙහි මූලික අවස්ථා පමණක් ක්ෂණික ව නිරූපණය කරයි. | ▪ මූලික කතා වස්තුව ක්ෂණික ව නිරූපණය කිරීම. | 5.1.2 ''පුංචි අපට දූන් තේරෙයි'' මූලික කතා වස්තුව විනාඩි 5-8ක් තුළ ක්ෂණික ව නිරූපණය කරයි. | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | (කතා වස්තුව හඳුනා ගනිමු.) | |
| | | ▪ පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ චරිත අතර වෙනස්කම් පැහැදිලි කරයි.<br>▪ කතා වස්තුවෙන් මතුවන තේමාවන් හඳුනාගෙන ප්‍රකාශ කරයි. | ▪ පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ තේමාව, චරිත අධ්‍යයනය | 5.1.3 කම්මැලි මීයන්ගෙන් අපිට පාඩම් | 01 |
| | 5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි. (පුංචි අපට දැන් තේරෙයි - සෝමලතා සුබසිංහ) | ▪ නාට්‍යයෙහි ඒ ඒ චරිතවල ස්වභාවයන් හඳුනාගෙන විස්තර කරයි.<br>▪ ''පුංචි අපට දැන් තේරෙයි''නාට්‍යයේ ගැටුම නිර්මාණය වී ඇති ආකාරය පැහැදිලි කරයි.<br>▪ නාට්‍යයට දායකවන ගායක පිරිසෙහි කාර්යය පිළිබඳ අදහස් දක්වයි. | ▪ නාට්‍ය නිෂ්පාදනය රස විඳියි. | 5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි<br>5.2.1 කුකුළුහාමි සහ මීයන්ගේ ගති ගුණයි ගායක පිරිසේ පණිවිඩයයි හොයා බලමු. | 01 |
| | | ▪ චරිත සඳහා සුදුසු සිසුන් තෝරා ගැනීමේදී සැළකිළිමත් වියයුතු කරුණු හඳුනා ගනී.<br>▪ අදාළ ආනුෂංගික කලා හැකියාවන් ඇති සිසුන් තෝරා ගනියි.<br>▪ නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට නියමිත බවට පෝස්ටරයක් නිර්මාණය කරයි.<br>▪ පුහුණුව සංවිධානය කරයි.<br>▪ සතර අභිනය භාවිත කරමින් නාට්‍යය රඟ දක්වයි. | ● ''පුංචි අපට දැන් තේරෙයි'' නාට්‍ය රඟ දක්වන්නට පන්තියේ ළමයි සූදානම් වීම.<br>● චරිත රඟපෑමට පෙර සංවාද පුහුණු වීම.<br>● අභිනය සහිත ව නාට්‍ය පුහුණු වෙමු.<br>● ආනුශංගික සැලසුම් කිරීම.<br>● නාට්‍ය රඟදැක්වීම.<br>● රඟ දැක්වූ නාට්‍යයේ ගුණදොස් විමසීම. | 5.2.2<br>5.2.3<br>5.2.4<br>5.2.5<br>5.2.6<br>} පුංචි අපට දැන් තේරෙයි නාට්‍ය නිෂ්පාදනය හා රස විඳීම. | 03 |